## කාලය මැවූ වෙනසක මහිමේ...
මාලි

වෙනදට නං රෑ තුරුළු කරන් මං
දැං තුරුළු කරන් දුරකථනය ඔහු
වෙනදට උදේම තුරුළු කරන් මං
දැං තුරුළු කරන් දුරකථනය ඔහු
දවස පුරාවට තුරුළු කරන් හිටි
මා අතහැර දූරකථනය වුනි ළං

එනමුදු, ලෙඩ වී කෙදිරි ගාන ඔහු
දවස පුරාවට මං සොයන්නෙ දැං
දුරකථනය නිහඬය දුටුවෙමි මං...
පුදුමය... කාලය මැවූ හැටි වෙනසක්...

## ගින්නෙන් උපන් ගින්දර
සු.ප්‍රි. සමරසිංහ

දියවුණේ එදා මල් සමය අපේ    සුන්දර
ඇවිලේ තවම සිත් තුළ උපන්    ගින්දර
කුමට ද සොයුර ඉතින් කයි    කතන්දර
මරණය පමණි උරුම වුණේ දොරින්    දෙර
සිප්හල වසා කඳවුරු ඉදි කළෙන්    සකී
මළමිනී උඩින් පැන අකුරට ගියෙන්    සකී
වැරදුණි අකුරු හිඩසකි පිරවිය    නොහැකී
ගැලවුණු එකම ජීවිත මහ    පුදුමයකී
තමන් හිසට නොමවිය තම    සෙවනැල්ල
අනුන් අතම විය දිවියේ    පණරැල්ල
ඉතින් ගහම දත් අපටය    සැඟවිල්ල
සිතින් බැරිය වහ ගන්නට    හෙලුවැල්ල
කැඳත් නොබී ගින්දර නිවුවත්    රැවුලේ
තිත්ත කසායයි අප බිව්වේ    හවුලේ
ගින්දර පුපුරු ඇත නොනිවී අළු    පල්ලේ
ගින්නෙන් උපන් ගින්දර තවමත්    ඇවිලේ

## නොනිමි සෙනෙහස
බණ්ඩාර කුමාරනායක

අලුත් නිවසක් සමග සැමියෙක් ජීවිතය
පැල කර තිබේ
රැදෙන තෙතමන සාර පොලවේ දලු
හිරුට එබෙමින් තිබේ
සරු ගසක්වී පල දරන්නට දුන්න උපදෙස්
සිහි තිබේ
මවක් බිරිදක් වී දැරූ බර අම්මෙ පුදුමයි
ජය ඔබේ

මහා ගල් පර නැගෙන ගින්දර පසු කරන්
කොහොමද ගියේ
නැගුනු අවමන් විද දරාගෙන ගිය වගට
සලකුනු තියේ
මවක් වෙන්නේ කෙලස ඔබ මෙන්
කුතුහලය සැගවී තිබේ
අම්මෙ කොහොමද තියා ගත්තේ උතුම්
දරු සෙනෙහස ලයේ

ගිමන් හරිනා ඇතින්නක මෙන් ආ මගේ
ජය දෙස බලා
සිටින අම්මා වරුන් ඔබවන් තවත් ලොව
ලස්සන කලා
මුලක් පැලයක් ගසක් සෙවනක් වෙන්නෙ
කෝමද පල නෙලා
කියා දුන් මව මග දමා යන දරුවෝ දැන් ඇත
බෝ වෙලා

## පෙරහැර සමය
ආනන්ද ගුණතිලක - හොපර්ස් ක්‍රොසිං

චට පට හඬ පතුරුවා කස පුපු    රනවා
ලොකු පොඩි ගිණි බෝල රවුමට කැර    කෙනවා
සිය ගණනක් නැටුම් එකිනෙක රඟ    දෙනවා
ඇසල මහේ පෙරහැර සිහියට    එනවා

දින ගණනක් පුරා නෙක නෙක හැඩ    ගත්තූ
රන් දෝලිය කුඹල් ආදී නම්    ගත්තූ
නාථ විෂ්ණු නාමෙට පන්දම්    ගත්තූ
පෙරහැර පුරා ඇත සිය ගණනක්    ඇත්තූ

වෙන කිසි රටක් තුල දැක ගන්නට    නොමැතී
විසිතුරු මහා සැනකෙළියකි අපට    ඇතී
එකකට එකක් පරපුරකින් බැඳුන    නිතී
දහසක් පිරිස එකතුව පෙරහැර    කරතී

පෙරහැර 'නුවර දළද' මුල් තැන    ගන්නේ
කැළණිය කෝට්ටේ බෙල්ලන්විල    එන්නේ
ගංගාරාමයත් ඒ ලඟටම    ඉන්නේ
පෙරහැර වල් රැසක් රට හැම තැන    යන්නේ

රත්න පුර සමන් දේවාලයෙ    ඉඳලා
'මහ බඹු' 'බොරු කකුල් කරුවන්' පිරි    වරලා
'කොහොඹ කළය' සරසා හිස මත    තියලා
ඔබටත් මතක් වෙනවද බැලු හැටි    දුවලා

ඇසල නිකිණි ඉදිරියෙ ඇති මාස    වල
පෙරහැර කිහිපයකි නෙත් සිත් වසඟ    කල
අප මෙහි ඉඳන් කැළඹූවත් 'මතක    විල'
සතුටක් කොහිද ලඟටම ගොස් නොබැලු    කල

රට යන විදිය ගැන අද නැත සැන    සිල්ලක්
'අවුරුදු' - 'වෙසක්' වලටත් නැහැ සැල    කිල්ලක්
අපෙ ගති සිරිත් මත - කරමින් රැව    ටිල්ලක්
දුව්ද දන්නෙ නැහැ පෙරහැරටත්    'පොල්ලක්'







## Stars are Bright

Stars are bright
in the night...
Stars give light
in the night...

Like a light
in the night...
Stars shine bright
in the sky...

**Sanuli Minaya Polkotuwe**
**Year 1**
**Montgrove College**
**Orchard Hills NSW**

